

ලක්රුහුණු මාසික දහම් පත්‍රය

# අමා ගඟුල July 2015

## සියළු සත්වයින් මත පතිතවන
## පර්වත සතර

**ශ්‍රී. බු. ව. 2559 ක්වූ අධි ඇසළ මස කලාපය, රා. ව. 2015 ක් වූ ජුලි මස 01 වන දින**

**වැලිගම ශ්‍රී සුගත ශාන්තිසේවා සංසදයේ නිර්මාතෘ ගරු යාවජීව සභාපති**

**ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත මහතා විසිනි.**

**නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!**

"යම්සේ මහත්වූ අහසතරම් උස ගල්පර්වතයෝ හාත්පස සතර දිසාවම සුණු කරමින් පෙරලී එන්නාහුද"

"ඒ පරිදිම ජරාවත් මරණයත් ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදී උසස් යයි සම්මත අයද ශුද්‍ර සැඩොල් ආදී පහත්යයි සම්මතවූ අයද තරාතිරමක් නැතිව සියලු සතුන් යට කරති කිසිවෙක් අත්නොහරී සියල්ලම මඩී"

ධම්කාමී පින්වතුනි,

අද අධි ඇසළ පුර පසළොස්වක පොහොය දිනයයි. මෙම සද්ධර්ම පණිවුඩය සඳහා මාතෘකා කරගනු ලැබූයේ සංයුත්ත නිකායේ කෝසල සංයුත්තයේ පබ්බතූපම සූත්‍රයයි. මහළුවීම, ලෙඩවීම, විපත්තිවීම, මරණය යන මේ ස්වභාව ධම් සතරට කවරු කැමති වුනත් නැතත් ඒවාට උපන් හැම සත්වයාටම අනිවාර්යයෙන්ම මුහුණදීමට සිදුවන බව භාග්‍යවතුන් වහන්සේ මගධාධිපති කෝසළ මහ රජතුමාට පැහැදිළිකර මේ සූත්‍රය දේශනා කොට ඇත.

සැවැත්නුවර දෙව්රම් වෙහෙරෙහි වැඩවාසය කරන භාග්‍යවතුන් වහන්සේ දැකීමට දිනපතාම රජතුමා නොවරදවා පැමිණෙනවා. මේ අතර රජතුමා එක්තරා දිනක භාග්‍යවතුන් වහන්සේ දැකීමට හදිසියෙ පැමිණිය. මහරජුගෙන් බුදුහිමියන් විමසනව "

මහරජ මේ දහවල් කොහි සිට එනවද?" රජතුමා කාරණය පැහැදිලි නොකර කියනව යම්කිසි රාජකාරියකට ගිහිං එන ගමන්ය කියල. එනමුත් බුදුහිමියන් දන්නව කුමකට ගිහිං එනවද කියල. රජතුමා තනියම බුදුහිමියන් දැකීමට ඒම සිරිතක් නිසා එක්තරා හොරු පිරිසක් කතිකා කරගත්ත එහෙම එන වෙලාවක රජතුමා මරා වස්තුව පැහැර ගනිමුයි කියල. එයින් එක හොරෙක් රජතුමා මුනගැසී කුමන්ත්‍රණය හෙළි කරල අනිත් හොරු ටික පාවල දුන්න. . රජතුමා හොරු වාසලට ගෙන්වා කරුණු විමසුව හොරු කිව්ව දුප්පත්කම නිසා එහෙම කරන්න හිතුව කියල. එය නිදහසට කාරණය නොවන නිසා හොරුටික ප්‍රසිද්ධියේ රට වැසියාට පේන්න උල තියල මරල දාන්න තීරණය කළා. අන්න ඒ කාරණයට ගිහිං එනගමං බුදුහිමියන්ට එය කියන්න බැරි නිසා රාජකාරියකට ගිහිං එනව කියල බොරු නොකියා කාරණය සඟවා කිව්වා. කාරණය බුදු නුවණින් දැන වදළ නිසා රජු අමතා මේ ධම්දේශනාව සිදු කළා.

මහරජ තොප විසින් ඉතා විශ්වාස කරන තම ජීවිතය රැකගැනීමටවත් බොරු නොකියන යම්කිසි ඇදහිය යුතු පිළිගත හැකි සත්‍ය වචන ඇති පුරුෂයෙක් තොපවෙත පැමිණ "දේවයන් වහන්ස මහා පුදුමයෙකි මම එන්නේ පෙරදිග සිට එහි අහස සමාන උස ඇති පර්වතයක් දැක්ක සියලු සත්වයින් සහ තිබෙනතාක් වස්තූන් සුනු විසුනු කරමින් මේ දෙසට පෙරලීගෙන එනව දුටුව. මහරජ මෙය මම දුටු පැහැදිලි සත්‍යයක් එම නිසා නුඹ වහන්සේ විසින් කළයුතු යමක් වෙත්නම් කරනු මැනවි."

මේ ආකාරයට දකුණ, බටහිර, උතුරු දිසාව සහිත සතර දිසාවෙන්ම පුරුෂයින් සතර දෙනෙකු පැමිණ එකම ආකාරයට රජතුමාට පවසා ඒ සතර දෙනාම කියනව මහරජ ඔබ විසින් මේ නිසා කළයුතු යමක් ඇත්නම් කරන්න යනුවෙන් සැළකරන බව. එසේ වදරා භාග්‍යවතුන් වහන්සේ විසින් මහරජුගෙන් මෙසේ විමසනව මහරජ මනුෂ්‍යාදී සත්වයන් මෙන්ම සියළු වස්තූන් නසන මහත්වූ බියක් සිව්දිගින්ම පැමිණෙන්නේ නම් එවැනි බියක් ඇතිවූ කල්හි දුර්ලභ මිනිසත්කමක් ඇත්තාවූ ඔබ විසින් කුමක් කරනවාද?

සවාමීනි එසේ වූ නපුරු බියක් හටගත්කල දුර්ලභ මනුෂ්‍යාත්මයක් ලබාසිටින මම දහමට අනුව හැසිරෙනවා හැර වෙනත් කළ යුතු යමක් මට වැටහීමක් නැතැයි කොසොල් මහරජතුමා පිළිතුරු දුන්නේය. ඉන්පසු භාග්‍යවතුන් වහන්සේ මුලින් සඳහන් කරන ලද අහස් උස හා සමාන මහා පර්වත හතරෙන් සත්වයා යටවී සුනු විසුනු වෙනවා වාගේ ජරා, මරණ දෙක තොපද සියළු සත්වයාද මැඩගෙන එන බැවින් මහරජ තොප විසින් කුමක් කළ යුතුදැයි විමසීය.

එවිට මහරජු විසින් සවාමීනි ජරා මරණ දෙක අප මැඩගෙන සිටි කල්හිද දහමට අනුව හැසිරීම හැර වෙනත් කළ යුත්තක් මට නොවැටහේ යයි පැවසීය.

දේශනා කරන ලද ගාථාවේ "එවං ජරාච මච්චුච" යනාදී වශයෙන් දැක්වේ. එනමුත් බුද්ධ වචනය තේරුම් ගැනීමේදී යොදා ගත යුතු න්‍යායයන් පූර්වාචාර්‍ය උතුමන් දක්වා ඇත. ඒ නිසා මෙහි ජරා, මරණ දෙක දැක් වූව ද තවත් කරුණු දෙකක් ව්‍යාධි, විපතති වශයෙන්ද ගත යුතුය. එවිට හතරකි. පර්වත හතරට උපමා කරන ලද්දේ එම හතරයි. මෙය මිගපදවලඤ්ජණ න්‍යාය ලෙස දැක්වේ. එය මෙසේය. පොලව මත පිහිටි ගලකි. මුවෙක් පැමිණ ගලට නගී ගලදෙසට පා සටහන් පිහිටයි. ගලෙන් බැසගිය බවට ගලට පිටුපා පා සටහන් දැක්වේ. තේරුම් ගත යුත්තේ මුවා ගලට නැග බැසගොස් ඇති බවයි. "ජරා" යන මුල් පදයත් "මරණ" යන අග පදයත් භාග්‍යවතුන් වහන්සේ වදරා ඇත්තේ "ව්‍යාධි" "විපත්ති" යන දෙකද ඒ අතරට එන හෙයිනි.

භාග්‍යවතුන් වහන්සේ උපමාවෙන් මහා පර්වත හතර දක්වා ජරා, ව්‍යාධි, විපත්, මරණ යන සතරාකාර සවභාව ධම් සතර උපන් සත්වයාට කිසි විට ඉක්මවිය නොහැකි බව වදළහ. ඒ නිසා මහරජුන් විසින් තමන්ගේ වැටහීම බුදුරජාණන් වහන්සේ ඉදිරියේදීම මෙසේ ප්‍රකාශ කරනව . සවාමීනි යස ඉසුරෙන් මත්වූ කම්සැප කෙරෙහි ගිජු බැවින් ගම් දනව් යටත් කොට අධිපති බවට පත්ව ඔටුනු පැළඳ වූ ක්‍ෂත්‍රිය කුල උපන් රජවරුන්ට යුධ කිරීමට බලසම්පන්න ඇත්, අශ්ව, රිය, පාබල සේනාවන් සිටියද මේ ජරා, ව්‍යාධි, විපත් මරණ සතරින් අප පෙළෙන විට ඒ සේනාවන් ලවා යුධ කළද එම යුද්ධයෙන් වැඩක් නොවේ. ඒ ජය ගැනීමට සමත් නොවේ. එමෙන්ම සවාමීනි යම් රජෙකුට එන සතුරන් ජය ගැනීමට එම සතුරන් බිඳුවාලන්නට සුදුසු මන්ත්‍රබල ඇති ඇමතිවරු සිටී. සවාමීනි සතුරන් ජය ගැනීමට මුදල් අල්ලස් දී පොළඹවා ගන්නට යම්කිසි ධනයක් රන්, රිදී, මුතු, මැණික් අප සතුව ඇත. එනමුත් සවාමීනි ජරා, මරණ දෙක එන විට එයින් ජයගැනීමට එම මන්ත්‍ර සහ ධනය සමත් නොවේ. වැඩක් නොවේ.සවාමීනි දහමට අනුව ජීවත්වීම හැර වෙනත් දෙයකින් ඵලක් නැති බව මගේ දැනීමයි.

ජරා,ව්‍යාධි, විපත්, මරණ යන මේ සවභාව ධර්‍ම සතර ලෝකයේ උපන් සෑම සත්වයෙකුටම ඒකාන්තයෙන්ම පැමිණ දුකට පත්කරයි. ඒ සඳහා ධනය, කුලය, බලය ආදී වූ තත්වයන් තිබුනා කියා  පිහිටක් නැත. ඒ බව කොසොල් රජතුමා විසින්ම චතුරංගිණී සේනාව ආදී යස ඉසුරු සම්පතින් වැඩක් නොවන බව කියයි.

ජරා පර්වතය යනු කවරේද? ජරා නම් දිරීමයි. අපගේ ශරීරය මවුකුස පහළ වූ ද පටන් දිරීම ආරම්භ කරනව ඉන්ද්‍රියන්ගේ මේරීම නිසා ඇතිවන්නා වූ සවභාවයයි. එවිට අපි කියනව අබලයි. දුබලයි කියල. මහළු වීම නාකී වීම යනුවෙන් කියනව දස බල ධාරීවූ බුදුරජාණන් වහන්සේටද මේ ජරා ධර්‍මය පැමිණියා. මහළු වනවිට තම අතපය තමන්ට වලංගු නැත. ආහාර ටිකවත් කටේ තබාගන්නට නොහැකිය. කෙටියෙන් කියන්නේනම් දිරීම හෙවත් ජරා ධර්‍මය තමන් සුනු විසුනු කරන මහා පර්වතයක් මෙනි. ඒ පිළිබඳ අවබෝධය නැත්තා තමන් සුනු විසුනු වන තු තඹන් සුනු විසුනු වන තුරු දන්නේ නැත. හැකියාව තිබියදී පිනක් දහමක්වත් කර ගැනීමට නොසිතයි. දිරාගිය පසු පිනට දහමට හිත යොමු වුවද දෑත ඔසවා තෙරුවන් වැඳීමටද හැකියාව නැත.

ව්‍යාධි පර්වතය යනු කවරේද? මනුෂ්‍යයා ඇතුළු සියලු සත්වයන් මත පතිතවන ඊළඟ මහා පර්වතය ව්‍යාධිය හෙවත් ලෙඩ වීමයි. ඉතා අතීතයේ පැවතියේ ලෙඩ තුනකි. බඩගින්න, ආහාර නොදිරවීම, දිරීම හෙවත් ජරාවට පත්වීමයි. අදවනවිට මෙතෙකැයි ගනන් සීමා කිරීමට නොහැකි ලෙඩ ඇතිවේ. ලෙඩ ඇතිවීමට හේතු වන්නේ වාතය, පිත, සෙම කිපීමෙන්, ඒ තුනම කිපීමෙන්, සෘතු විපර්යාසයෙන්, විෂමාචාර පැවැත්මෙන්, උපක්‍රමයෙන්, කර්‍ම විපාකයෙන් යන හේතූන් බව දේශනාවෙහි දැක්වේ.

ගිහි හෝ වේවා පැවිදි හෝ වේවා කුමන තරාතිරමක වුවද තමන් යම් දියණුවක් ලබා තිබුනත් රෝගාතුරනම් එයින් ප්‍රයෝජන ගත නොහැකිවේ. නිවන් දැකීමටද නිරෝගි විය යුතු නිසා "ආරෝග්‍යා පරමා ලාභා" යනුවෙන් දේශනා කොට ඇත. රෝගාතුරවීම සවභාව ධර්‍මයෙකැයි අමතක නොකොට හැමදෙනා මතම පතිත වන මහා පර්වතයෙකැයි සිතා තම කැමැත්ත අකමැත්ත මත සිදු නොවන බව දැන රෝගයන් පැමිණීමට පෙර තම තමන් සතු වැරදි නිවැරදි කරගෙන ධර්‍මානු කූලව තම දිවිපෙවෙත පැවැත්විය යුතුබව අධිෂ්ඨාන කර ගත යුතුයි.

විපත්ති පර්වතය යනු කවරේද? තම බලාපොරොත්තු දේ ඉටුනොවීම කැමැත්තට පටහැනි විරුද්ධව පැමිණෙන අනිටු දේ සියල්ලම විපත්ය. තමන්ට තිබූ සම්පත්තියක් බලා පොරොත්තු නොවූ පරිදි නැතිවීම විපත්ති නමින් හැඳින්වේ. මේ විපත්ති වලට කැමති කිසිදු සත්වයෙක් නැත. විපත්ති කරගන්නේත් සම්පත්ති තමන් හිතූපරිදි නොවීම නැමති විපත්තිය නිසාය. කාගේත් බලාපොරොත්තුව සම්පත් විඳීමටයි. විපත්ති වලින් දුරු වීමටයි. සතුටුවෙමින් හැමදම වාසය කිරීමටයි.  මේ ලෝක ධාතුවතුල කිසිවෙකුට එසේ වූ සම්පත්තියක් ඇතිනොවේ. විපත්තීන්ගේ ප්‍රමාණය මෙතෙකැයි සීමා කළ නොහැකිය. අප්‍රමාණ විපත්ති ඇතිවේ. පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතරමහා ධාතූන් කිපීමෙන් භූකම්පන, ගස්ගල් පෙරලීම,  කඳු නායයෑම,  ජල ගැලීම්, ගිනිකඳු පිපිරීම්, ලැව්ගිනි, සුලිසුලං ආදී ඉතා දරුනු විපත්තිද එයින් සඳාතීන් අහිමිවීම, සතුරු උපද්‍රව, රෝග පීඩාවන්ගෙන් ව්‍යසන රිය අනතුරු ආදී මෙකී නොකී විපත්ති ඇතිවේ. අපරටට ඉහතකී විපත්ති ඉතා අඩුය. මංගල සූත්‍රයේ සඳහන් යහපත් කරුණු අතර "පතිරූප දේස වාසය" අප රටේ ඇත. උතුසපපාය (හොඳ දේශගුණය) භෝජන සපපාය (සුදුසු ආහාර) පුගගල සපපාය ( ඇසුරට සුදුසු පුද්ගලයන්) ධමමසසවණ සපපාය (බණ දහම් ඇසීමට ඇති පහසුව) මේවායින් යුක්තය දැන් දැන් ඒ සම්පත්ති විපත්ති බවට පත්කිරීමට අධිවේගයෙන් පස්කම් සැපයට ගිජුවී ඇතැම් නායකයෝ ඇතුළු සෙසු ඇතැමුන් කරන අධර්‍ම ක්‍රියා හේතුවෙන් පසුබිම සකස්වෙමින් පවතිනබව වගකිව යුත්තෝ කුමන ජාතියක ආගමක වුවද සිතා මතා ඒ වේගය අඩු කරගැනීමට වැට කඩුලු බැඳිය යුතුය. මේ දේශය භාග්‍යවතුන් වහන්සේ තුන්වාරයක් වැඩම කොට මහරහතුන් සමග දහසය ස්ථානයකදී සමාපත්ති සුව විඳ බුද්ධ පරිහරණයෙන් පූජනීය කොට සක්දෙවියන්ටද ලක්බිමේ සසුන පිහිටනබව වදාරා ඇත. එහි මිනිසුන් දැහැමි විය යුතුමය.

මරණ පර්වතය යනු කවරේද ? මරණය නම් උප්පත්තියක් යම් තැනක සිදුවීනම් එහි අවසානයයි. මරණය සතර ආකාරයකි. ආයුක්ඛය මරණය (ඒ ඒ කාලවල සහ ස්ථානවල ජීවත්වියහැකි ආයුෂ අවසාන වීමෙන්) කම්මක්ඛය මරණය ( (දුර්වල කර්‍ම ශක්තියක් ඇතිව ඉපිද ආයුබල තිබියදී ජනක හෙවත් උප්පත්ති කර්‍මශක්තිය අවසන්වීමෙන් ) උභයක්ඛය මරණය   (ආයුෂත් කර්‍මශක්තියත් දෙකම අවසන් වීමෙන්) උපච්ඡේදක මරණය (ආයුෂත් ප්‍රතිසන්ධි ජනකකර්‍ම ශක්තියක් ඉතිරිව තිබියදී රෝගාදී නොයෙක් හේතූන් නිසා හදිසියේ

සිදුවන මරණය) උදාවූ හිරු අවරට යන්නාක් මෙන් මවකුස පහළ වූ මොහොතේ පටන් මරණයට ලංවීම මරණ පර්වතය තමන් මත පතිත වීමයි. "සබ්බෙ සත්තා මරිස්සන්ති මරණන්තං හි ජීවිතං" (සියළු සත්වයෝ මැරෙන්නාහ ජීවිතය මරණය කෙළවර කොට ඇත.)

මෙසේ මිනිසුන් මත පතිතවන පර්වත හතර තම තමන් වඩාත් පැහැදිළිකරගත යුතුය. එම පර්වත සතර මහපොළවට අධිපති කාමයෙහි ඔටුනු පැළඳි රජවරුන්ටත් බුද්ධියේ ඔටුනු පැළඳි කාමාදී ආශ්‍රවයන්ගෙන් මිදුනු බුදු, පසේබුදු, මහරහත් උතුමන් වහන්සේලා මතත් සෙසු සියල්ලන් මතත් පතිතවන බව වදාළහ.

ඊලඟට සිහිපත් කළ යුතු වන්නේ භාග්‍යවතුන් වහන්සේ මහ රජතුනමාට අවවාද වශයෙන් මහරජ මේ ජරා, ව්‍යාධි, විපත්, මරණ යන මහා පර්වත සතර තමන් මත පතිතවන විට සතර සේනා බලයෙන්, මන්ත්‍රයෙන්, ධනයෙන්, පිහිටක් නැත. ධර්මානුකූල විම කුසල් ක්‍රියාවන්හි යෙදීම පිහිටකි යනුවෙනි. ඒ සඳහා ත්‍රිවිධ රත්නය කෙරෙහි සිත පිහිටුවා ගත යුතුය. දසකුසල් කළ යුතුය. එනම්, 1.ප්‍රාණ ඝාතයෙන් වෙන්වීම, 2.හොරකමින් වෙන්වීම, 3.වැරදි කාම සේවනයෙන් වෙන් වීම, 4.බොරු නොකීම, 5.කේලාම් නොකීම, 6.පරුෂ වචන නොකීම, 7.හිස් වචන නොකීම, 8.විෂමවූ ලෝභයෙන් වෙන්වීම (අභිධ්‍යාව), 9.තරහින් වෙන්වීම (ව්‍යාපාදය), 10.මිථ්‍යා දෘෂ්ඨියෙන් වෙන් වීම මෙම දහයෙන් වෙන්වී ධර්මානුකූල වීම විනා වෙනත් කළ යුත්තක් නැති බව මහාකරුණාවෙන් යුතුව වදාරා ඇත. " බුද්ධෙ ධම්මෙ ච සඞ්ඝෙ ච ධීරෝ සද්ධං නිවෙසයෙ" . ත්‍රිවිධරත්නය පිළිබඳ ශ්‍රද්ධාව තිබිය යුතුය. මිථ්‍යා අදහස් දුරු කළ යුතුය. එමෙන්ම ඇසළ මාසය දෙවියන් පිළිබඳව බොහෝ දෙනා උනන්දු වන මාසයකි. බෞද්ධයින්ටද ඇසළ මාසයේදී දිව්‍ය බ්‍රාහ්මාදීන් සිහිපත්වනු ඇත. ඒ වෙන කිසිවක් නිසා නොව පළමු ධර්ම දේශනයේදී භූමිනිශ්‍රිත සහ සදෙව් තල බ්‍රහ්ම තල දෙවියෝ තෙරුවන් කෙරෙහි පැහැදී සාධූ නාද පැවැත්වීම සිහිවන විටය. මනුෂ්‍යයින් වන අපට දෙවියන්ගේ පිහිට ආරක්ෂාව ඇතිවන්නේ පබ්බතූපම සූත්‍රය අවසානයේදී බුදුරජාණන් වහන්සේ මෙසේ වදාරණ නිසාය.

"යො ධම්මචාරී කායේන වාචාය උද චෙතසා ඉධෙව නං පසංසන්ති පෙච්ච සග්ගෙ පමොදතීති"

"යමෙක් කයෙන්ද වචනයෙන්ද සිතෙන්ද ධර්මයෙහි හැසිරේද නුවනැත්තෝ ඔහුට ප්‍රසංසා කරති.

පරලොව සුගතියෙහි සතුටු වෙති".

දෙවියන්ද නුවන ඇති ඇත්තන්ය. තෙරුවන් සරණ ගොස් මිථ්‍යාවෙන් වැලකී ඉතා දුර්ලභ මනුෂ්‍යත්වයක් ලබාගත් මනුෂ්‍යයාට විපත්ති පැමිණෙනවිට දෙවියන් ඒ ගුණ දහමින් යුතු මනුෂ්‍යයන්ට පිහිට වී පින් සිදුකරගන්න නොඉවසිල්ලෙන් සිටිති. විපතක් වූ විට ඒ සත් පුරුෂයාට දෙවියන් පිහිට වී දෙවියන් පිං සිදුකර ගනිති. ශක්‍ර දෙවියන් ආදී දෙවියන්ට පිං සිදුකර ගැනීමට දැන් ලොව වෙසෙන මනුෂ්‍යයන් ගුණ දහමින් යුතුද? මිත්‍යාවෙන් වැලකී දසකුසල් කරනවාද? යනුවෙන් තම තමන් තීරණය කර ගත යුතුය. දැන් දැන් මනුෂ්‍යයෝ ලාභ ප්‍රයෝජන ලබාගැනීමට දෙවියන් අනුවනයෝය සිතා දේව විශ්වාස ඇතිකර ගත්තත් දෙවියන්ට මනුෂ්‍යයෝ විශ්වාස නැත. ලොවුතුරා බුදුපියාණන් වහන්සේ මැනවින් වදාළ ධර්මයට අනුව ජීවත්වන මනුෂ්‍යයාට වෙනත් ක්‍රම උපායන් යාග හෝ නැටුම් වැයුම් පූජා වට්ටි අවශ්‍ය නොවේ. ධර්මානු කූල වීමෙන්ම දේවතා රැකවරණ ලැබේ මේ අනුව හිතට එකඟව සිතා බැලීම තම තම නැණ පමණින් කළ යුතුය. පබ්බතූපම සූත්‍රයට අනුව මිනිසුන් මත පතිත වන විපත් හතරින් වැලකීමට දහමට අනුව ජීවත්වීම විනා වෙනත් පිහිටක් නැතිබව පැහැදිළි වේ. දෙවියන්ටද ඒ දහම එසේමය. සැමට උතුම් සද්ධර්මයේ පිහිටෙන් ජරා මරණ දෙකෙන් තොර නිවන් සුව ප්‍රත්‍යක්ෂ වේවා.!

තෙරුවන් සරණයි... !